wd¾:sl úoHdj
13 fY%aKsh
7 . uqqo,a yd nexl=
ví î wurfiak
r$ nqoaOchka;s uyd úoHd,h

නිපුණතාව 7.0

: මුදල් හා මිල මට්ටම් වල හැසිරීම් හඳුනා හඳුනාගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට බැංකු පද්ධතිය දායක වන ආකාරය විමර්ශනය කරයි

නිපුණතාව 7.0 : මුදල් හා මිල මට්ටම් වල හැසිරීම් හඳුනා හඳුනාගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට බැංකු පද්ධතිය දායක වන ආකාරය විමශර්නය කරයි

නිපුණතා මට්ටම 7.1 : **මුදල් , මුදල් වර් ග හා මුදලේ කායර්යන්**

❖ **මුදල්**

- භාණ්ඩ හා සේවා හුවමාරු කර ගැනීම සඳහා පොදුවේ පිළිගත් ඕනෑම මාධ්‍යක් මුදල් ලෙස නිවර්චනය කරයි.
- හුවමාරුව කාර් යක්ෂමව සිදු වීමට හොඳ මුදලක තිබිය යුතු ලක්ෂණ

  - පොදු පිළිගැනීමක් තිබීම
  - කුඩා කොටස් වලට බෙදිය හැකි වීම
  - රැගෙන යාමේ පහසුව
  - කල්පැවැත්ම
  - සමජාතීය වීම
  - වටිනාකම වරින් වර වෙනස් නොවීම
  - පහසුවෙන් හඳුනාගැනීමට හැකිවීම
  - අනුකරණ මුදල් නිකුත් කිරීමේ අපහසුව
  - නිත්‍යානුකූල වලංගුභාවය

❖ **මුදලේ ප්‍රධාන කාර්යයන් :-**

1. **විනිමය මාධ්‍යක් ලෙස කටයුතු කිරීම**
   - භාණ්ඩ හා සේවා මෙන්ම සාධක සේවා හුවමාරු කරගැනීමට අතරමැදි මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම
   - මුදල් අතරමැදි කාර් යයක් ඉටු කරන නිසා. හුවමාරු ක්‍රමයේ මෙන්; ද්විත්ව සමපාතයක් අවශ්‍ය නොවේ
   - ශ්‍රම විභජනය සහ විශේෂීකරණය වැනි දියුණු නිෂ්පාදන ශිල්පීය ක්‍රම බිහිවීම
   - මහා පරිමාණ නිෂ්පාදන බිහි වීම
   - දේශීය හා විදේශීය වෙළෙඳාම පුළුල් වීම
   - උපකාරක සේවාවන් පුළුල් වීම

2. වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම

- අපහපහසුතාසුතාවයකින් තොරව අනාගත අවශ්‍යතා සඳහා ධනය රැස්කර තබා ගැනීමට මුදල් යොදා ගැනීම.
- භාණ්ඩවලින් ධනය රැස්කර තබා ගැනීමේදී ඇතිවන අපහසුතාවන් මේ නිසා ඉවත් වේ.
- මුදල් පූර් ණ ද්‍රව්‍යශීල වත්කමක් වන නිසා ධනය රැස්කර තබා ගැනීමට මිනිසුන් පෙළඹේ.

3. ගිණුම් ඒකකයක් ලෙස කට කටයුතු කිරීම

- භාණ්ඩ හා සේවා වල; ප්‍රාග්ධන වත්කම් වල; මෙන්ම ව්‍යාපාර වල ලාභ ගණනය කිරීමටත් ජාතික ආදායම ගණනය කිරීමටත් මුදල් නමැති මාධ්‍යයට ඇති හැකියාව මෙයින් අදහස් වේ.
- දේශීය හා විදේශීය වශයෙන් සිදුවන ගනුදෙනු වල මූල්‍ය තත්ත්වය වාර් තා කිරීමට මේ මගින් හැකියාව ලැබේ.

4. **විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම**
   - කල් පසු වූ ගෙවීම් කාර් යක්ෂමව පියවීමට ඇති හැකියාව මෙයින් අදහස් වේ.
   - අවදානමකින් තොරව ණය ගනුදෙනු සිදු කිරීමට මෙමගින් හැකියාව ලැබේ.

❖ ඉහත කායර්යන් ඉටු කිරීමේදී මුදලේ අගය ස්ථාවර පැවතීම ඉතා වැදගත් වේ.

❖ **වර් තමානයේ භාවිතා වන මුදල් වර් ග**

1. **ව්‍යවහාර මුදල්**
   - කිසියම් වටිනාකමක් නියෝජනය කිරීම සඳහා රටේ මූල්‍ය අධිකාරිය විසින් නිකුත් කරන ලද කාසි හා නෝට්ටු ව්‍යවහාර මුදල් වේ
   - රට තුළ ඕනෑම ගණුදෙනුවක් සිදු කිරීම සඳහා නෛතික වලංගු බවක් ව්‍යවහාර මුදල් තුළ පවතී

- ව්‍යවහාර මුදල් පූණර් ද්‍රව්‍යශීලතාවකින් යුක්ත වේ.

බැංකු මුදල්

- ජංගම ගිණුම්වල ඇති මුදල් ශේෂ බැංකු මුදල් වේ.
- ඉල්ලුම් තැන්පතු ලෙසද මේවා හඳුන්වයි
- ව්‍යවහාර මුදල් මෙන් ඉහළ ද්‍රවශීලීතාවක් පවතී

3. ආසන්න මුදල්

- මුදලේ කාර්යන් අතුරින් විනිමය මාධ්‍යක් ලෙස ක්‍රියා නොකරන; එහෙත් වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියා කරන මුදල් ආසන්න මුදල් වේ
- ආසන්න මුදල් ද ව්‍යවහාර මුදල් සහ බැංකු මුදල් තරම් ඉහළ ද්‍රවශීලීතාවක් නොපැවැතියත් ද්‍රවශීලීතාවක් පවතී
- කෙටි කාල පමාවකින් හුවමාරු මාධ්‍යයක් බවට පත්කර ගැනීමට හැකියාවක් තිබේ

  උදා:- ස්ථාවර හා ඉතුරුම් තැන්පතු ,භාණ්ඩාගාර බිල්පත් ,පොරොන්දු නෝට්ටු , විනිමය බිල්පත්

4. මුදල් ආදේශක

- මුදලේ කාර්යයන් අතුරින් තාවකාලික හුවමාරු මාධ්‍යයක් ලෙස කටයුතු කරන , වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු නොකරන මූල්‍ය උපකරණයි.

  උදා:- ණයපත් , හරපත්

- කෙටිකාලීන ගනුණුදෙනු සඳහා මෙම මුදල් ආදේශක යොදා ගැනීමට හැකිවේ.
- ණයපත් යනු මූල්‍ය ආයතනයක් යම් සීමාවකට යටත්ව භාණ්ඩ හා සේවා මිලදී ගැනීමටත්; අවශ්‍ය විට මුදල් ලබා ගැනීමටත්. අවසර ලබා දෙමින් නිකුත් කරන විද්‍යුත් කාඩ්පත් විශේෂයකි
- හරපතත් යනු ගනුදෙනුකරුවන් මූල්‍ය ආයතන වල මුදල් තැන්පත් කළ පසු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් මුදල් ලබා ගැනීමට භාවිතා කරන කාඩ්පත් විශේෂයකි

5. විද්‍යුත් මුදල්

- විද්‍යුත් ක්‍රමයට මුදල් ගබඩා කර තබා මෘදුකාංග මගින් ගණුදෙනු සඳහා යොදාගැනීම විද්‍යුත් මුදල් ලෙස හඳුන්වයි
- උදා:- හරපත් , ණයපත් , E-banking , Easy cash , Bit coin

නිපුණතා මට්ටම 7.2 : මුදලට ඉල්ලුමක් ඇති විට බලපාන හේතු සහ මුදල් ඉල්ලුම තීරණය කරනු ලබන සාධක

- **මුදල් ඉල්ලුම / මුදලේ ද්‍රව්‍යශීලීතාවරණය**
  - කිසියම් අවස්ථාවකවක මහජනතාව මුදල් , මුදල් ශේෂ වශයෙන් ළඟ තබා තබා ගැනීමට දක්වන කැමැත්ත මුදල් ඉල්ලුමයි

- **මුදල් සඳහා ඉල්ලුමක් ඇති වීමට බලපාන හේතු :-**

1. ගනුදෙනු චේතනාව
2. ආරක්ෂණ චේතනාව
3. සමපේක්ෂණ චේතනාව

❖ ගනුදෙනු චේතනාව මත මුදල් ඉල්ලුම්

- පුද්ගලයන්ට මුදල් ලැබෙන හා වියදම් කරන කාල පරාසය තුල සිදුවන ගනුදෙනු පියවා ගැනීමට මුදල් ශේෂ ලබා ළඟ තබා ගැනීමට දක්වන කැමැත්ත මුදලේ ගනුදෙනු ඉල්ලුමයි
- ගනුදෙණු චේතනාව මත කොතරම් මුදල් ප්‍රමාණයක් ළඟ තබා ගන්නේ දැයි තීරණය වන්නේ පුද්ගලයන්ගේ ආදායම් මට්ටම මතය
- ගනුදෙනු චේතනාව හා මුදල් ඉල්ලුම අතර පවතින්නේ අනුලෝම සම්බන්ධතාවයකි



- ආදායම ඉහළ මට්ටමක පවතින විට වැඩි මුදල් ප්‍රමාණයක් ළඟ තබා ගන්නා අතර ආදායම අඩු මට්ටමක පවතින විට ළඟ තබා ගන්නා මුදල් ප්‍රමාණය අඩු කරයි

❖ **ආරක්ෂක චේතනාව මත මුදල් ඉල්ලුම :-**

- සැලසුම් නොකළ ලෙඩදුක් ,විපත් ,හදිසි අනතුරු වැනි අනපේක්ෂිත වියදම් පියවා ගැනීමට මිනිසුන් මුදල් ළඟ තබා ගන්නේ ආරක්ෂණ චේතනාව මතය.
- මෙම චේතනාව මත කොතරම් මුදල් ප්‍රමාණයක් ළඟ තබා ගන්නේ ද යන්න තීරණය වීමේ ප්‍රධාන සාධකය වන්නේ ආදායම් මට්ටමයි.
- ආරක්ෂණ චේතනාව හා මුදලට ඇති ඉල්ලුම අතර පවතින්නේ අනුලෝම සම්බන්ධතාවකි



- ඉහළ ආදායමක් පවතින විට ආරක්ෂකණ චේතනාවෙන් වැඩි මුදල් ප්‍රමාණයක් ළඟ තබා ගන්නා අතර පහළ ආදායමක් පවතින විට අඩු මුදල් ප්‍රමාණයක් ළඟ තබා ගනී

❖ සමපේක්ෂණ චේතනාව මත මුදල් ඉල්ලුම

- ලාභ ලබා ගැනීම සඳහා මුදල් ආයෝජනයය කිරීමට මුදල් ළඟ තබා ගැනීම සමපේක්ෂණ මුදල් ඉල්ලුමයි.
- සමපේක්ෂණ මුදල් ඉල්ලුම පොලී අනුපාතිකය සමඟ සංවේදී වෙමින් තීරණය වේ.
- මුදල් ළඟ තබා ගැනීමෙ ආවස්තික පිරිවැය අභිමිවන පොලී අනුපාතිකයයි.

- ලාභ ඉපයීමේ වත්කමක් ලෙස පිළිණපත් හා මුදල් අතර තේරීම් කරන්නේ පොලී අනුපාතිකයට සංවේදී වෙමින්ය.

❖ **පිළිණපත් මිල හා පොලී අනුපාතික අතර සම්බන්ධය**

- පිළිණපත් මිල හා පොලී අනුපාතිකය අතර පවතින්නේ ප්‍රතිවිරුද්ධ සම්බන්ධයකි. එනම් පිළිණපත් මිල ඉහළ මට්ටමක පවතින්නෙ පොලී අනුපාතිකය පහළ මට්ටමක පවතින විට දීය. එමෙන්ම පොලී අනුපාතිකය ඉහළ මට්ටමක පවතින විට පිළිණපත් මිල පහළ මට්ටමක පවතී.



- වර්තමානයේ ඉහළ පොලී අනුපාතිකයක් පවතින විට පිළිණපත් මිල පහළ මට්ටමක පවතී. අනාගත පොලී අනුපාතික පහළ යනු ඇතැයි සාමපේක්ෂකයො කල්පනා කර ති. එසේ වුවහොත් අනාගත පිළිණපත් මිල ඉහළ යයි. එම නිසා වර්තමානයේ අඩු මිලට ඇති පිළිණපත් ලහි ලහියේ මිලදී ගනිමින්. මුදල් ශේෂ අඩු කරගන්නේ අනාගතයේ වැඩි මිලට විකුණා ලාභ ලබා ගැනීම සඳහාය. එය **ගැනුම් නැඹුරු සමපේක්ෂණය** ලෙස හඳුන්වයි.

- වර්තමානයේ පොලී අනුපාතිකය පහළ මට්ටමක පවතින විට වර්තමාන පිළිණපත් මිල ඉහළ මට්ටමක පවතියි. අනාගත පොලී අනුපාතික ඉහළ ගියහොත් පිළිණපත් මිල පහළ යන අතර අනාගත අලාභ අවම කර ගැනීමට වර්තමානයේ පිළිණපත් අලෙවි කර ලග ලබා ගන්නා මුදල් ශෙෂ ප්‍රමාණය වැඩි කරයි. එය **විකුණුම් නැඹුරු සමපේක්ෂණය** ලෙස හඳුන්වයි.

❖ **මුදල් ඉල්ලුම තීරණය කරන සාර් ව ආර්ථික විචල්‍යයන්**

- මූර් ත ආදායම
- පොලී අනුපාතිකය

- මිල මට්ටම
- ආයතනික සාධක
- මූල්‍ය වෙළෙඳපොළ නව්‍යතා
- අනාගත අපේක්ෂණ

නිපුණතා මට්ටම 7.3 : මුදල් සැපයුම විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කරයි

❖ **මුදල් සැපයුම**

- යම්කිසි අවස්ථාවක මහජනයා සතුව පවතින මුදල් තොගය මුදල් සැපයුමයි. මෙය මූල්‍ය සමාහාරය. මූල්‍ය තොගය ලෙස ද හඳුන්වයි.

- කාලයෙන් කාලයට මුදල් ලෙස පිළිගන්නා ආසන්න මුදල් සංරචක වෙනස්වීමත්. මූල්‍ය පද්ධතියේ සිදුවන ඇතැම් වෙනස්කම් හේතු කොට ගෙන මුදල් සැපයුම ආකාර 4ට නිර්වචනය කරයි.

❖ ශ්‍රී ලංකාවේ මුදල් සැපයුමේ විවිධ ස්වරූප

1. පටු මුදල් සැපයුම (m1)
2. පුළුල් මුදල් සැපයුම (m2)
3. ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (m2b)
4. වඩාත් පුළුල් මුදල් සැපයුම (m4)

- ඉහත මුදල් සැපයුමේ ප්‍රභේද වලට ඇතුලත් කරගන්නා මූල්‍ය සංරචක පහත සඳහන් පරිදි වේ.

1. මහජනයා සතු ව්‍යවහාර මුදල් (CP)
2. මහජනයා සතු වාණිජ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු (DDP)
3. මහජනයා සතු වාණිජ බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු (TSDP)
4. ගැලපුම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු (AFD)
5. විශේෂිත බැංකුවල මහජනයා සතු තැන්පතු (LSB)
6. ලියාපදිංචි මූල්‍ය සමාගම් වල මහජනයා සතු තැන්පතු (RFC)

ඒ අනුව

1) $m_1 = CP + DDP$
2) $m_2 = m_1 + TSDP$
3) $m_2b = m_2 + AFD$
4) $m_4 = m_2b + LSB + RFC$

- m2b මුදල් සැපයුම් ගණනය කිරීමේ දී මීට පෙර යොදාගත් අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වල නේවාසික තැන්පතු (NRFC) සහ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල නේවාසික තැන්පතු (FCRC) 2018 වෂර්යේ සිට යොදා නොගන්නා අතර. ඒවා වතර්මානයේ සලකන්නේ ගැලපුම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු (AFD) ලෙස.

- ගැලපුම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සකස් වන්නේ සංරචක 2කිනි.

  1) අක්වෙරල බැංකු ඒකකවල නේවාසික තැන්පතු
  2) දේශීය බැංකු ඒකකවල විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු වල දේශීය වගකීම් වල කොටසක්.

අභ්‍යාස

කල්පිත ආර්ථිකයක මූල්‍ය සමාහාරයට ඇතුළත් මූල්‍ය සංරචක කිහිපයක් පහතින් දැක්වේ.

ගැලපුම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු 100
මහජනයා සතු ව්‍යවහාර මුදල් 300
මහජනයා සතු වාණිජ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු 700
වාණිජ බැංකුවල ඇති සංචිත මුදල් 200
රාජ්‍ය නියෝජ්‍යායතන සතු මහ බැංකුවේ තැන්පතු 50
මහ බැංකුවේ ඇති වාණිජ බැංකු තැන්පතු 150
මහජනයා සතු වාණිජ බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු 800
විශේෂිත බැංකුවල මහජනයා සතු තැන්පතු 180
ලියාපදිංචි කළ මූල්‍ය සමාගම් වල මහජනයා සතු තැන්පතු 80

පහත සඳහන් ඒවා ගණනය කරන්න

1) පටු මුදල් සැපයුම (m1)
2) පුළුල් මුදල් සැපයුම (m2)
3) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (m2b)

4) වඩාත් පුළුල් මුදල් සැපයුම (m4)

5) පූර් ණ ද්‍රව්‍යශීල වත්කම්

6) ආසන්න මුදල් සංරචකවල වටිනාකම්

7) පදනම් මුදල් / අධිබලැති මුදල් / සංචිත මුදල්

8) m1 , m2 , m2b සහ m4 මුදල් සැපයුම් වලට අදාල මුදල් ගුණකයෙ අගයන් ගණනය කරන්න.

❖ **පදනම් මුදල්**

- රටක මුදල් සැපයුමට පදනම සපයන මහ බැංකුවේ සෘජු මූල්‍ය වගකීම් පදනම් මුදල් ලෙස හඳුන්වයි

❖ **පදනම් මුදල් වල සංරචක**

- මහජනයා සතු ව්‍යවහාර මුදල් (CP)
- වාණිජ බැංකු සතු සංචිත මුදල් (CKb)
- වාණිජ බැංකු මහබැංකුවේ පවත්වාගෙන යන තැන්පතු (RR)
- රාජ්‍ය නියෝජිත ආයතන මහ බැංකුවේ පවත්වාගෙන යන තැන්පතු (DoI)

$$H = CP + CKb + RR + DoI$$

❖ **මුදල් ගුණකය** (K)

- ආර්ථිකයේ පදනම් මුදල් සහ මුදල් සැපයුම අතර පවතින අනුපාතය මුදල් ගුණකය වේ.

$$\text{මුදල් ගුණකය} = \frac{\text{මුදල් සැපයුම}}{\text{පදනම් මුදල්}}$$

- මුදල් ගුණකය m1 , m2, m2b , m4 මූලාය සමාහාරයක් සඳහා වෙන වෙනම ගණනය කිරීමට පුළුවන.
- ඉහත අභ්‍යාසයෙ පදනම් මුදල් මෙන් කී ගුණයකින් මුදල් සැපයුම පවතින්නේ ද යන්න හඳුනා ගන්න.

❖ **මුදල් සැපයුම තීරණය කිරීමට බලපාන සාධක**

1) බැංකු ක්‍රමය සතු ශුද්ධ දේශීය වත්කම්

- මහ බැංකුව රජයට සපයන ණය
- වාණිජ බැංකු රජයට සපයන ශුද්ධ ණය
- වාණිජ බැංකු පෞද්ගලික අංශයට සපයන ශුද්ධ ණය
- වාණිජ බැංකු රාජ්‍ය ආයතන වලට සපයන ශුද්ධ ණය

2) බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම්
- මහබැංකුව සතු ශුද්ධ විදේශ වත්කම්
- වාණිජ බැංකු සතු ශුද්ධ විදේශ වත්කම්
- බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් යනු මහබැංකුව හා වාණිජ බැංකු සතු ශුද්ධ විදේශ වත්කම් හා වගකීම් අතර වෙනසයි.

3) අනෙකුත් ශුද්ධ වත්කම්

- ඉහත සඳහන් පරිදි මහබැංකුව සහ වානිජ බැංකු වල ශුද්ධ විදේශ වත්කම් හැර වෙනත් වත්කම් මෙයින් අදහස් වේ.

❖ **මහබැංකුව සතු ශුද්ධ විදේශ වත්කම් පහත සඳහන් සංරචක වලින් සමන්විත වේ.**

- මහ බැංකුව සතු විදේශ මුදල්
- විදේශ රටවල් සුරකුම්පත් වල මහබැංකුව කර ඇති ආයෝජින
- මහබැංකුව නමින් පවත්වාගෙන යන විදේශ ගැණුම් හිමිකම්

❖ **මහබැංකුව සතු විදේශ වගකීම්**

- විදේශ රටවලින් මහ බැංකුව ලබාගෙන ඇති ණය
- විදේශ මූල්‍ය ආයායතන මහ බැංකුවේ තැන්පත් කර ඇති මුදල්

❖ **වාණිජ බැංකු සතු විදේශ වත්කම්**

- විදේශ බැංකුවලට සපයා ඇති ණය
- වාණිජ බැංකු සතු විදේශ මුදල්
- වට්ටම් කල බිල්පත්

❖ **වාණිජ බැංකු සතු විදේශ වගකීම්**

- විදේශ බැංකු වලින් ලබාගත් ණය
- විදේශීය මූල්‍ය ආයතන දේශීය බැංකුවල පවත්වාගෙන යන තැන්පතු

නිපුණතා මට්ටම 7.4 මිල මට්ටම ආශ්‍රිත සංකල්ප; න්‍යාය සහ මිනුම්; විශ්ලේෂණය කරයි

- **මිල නැමැති සංකල්පය තුළ අන්තගර්ත වැදගත් ස්වරූප 3ක් තිබේ.**

1) නිරපේක්ෂ මිල
   - කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් වෙන් කර ගත් විට එහි සඳහන් මිල නිරපේක්ෂ මිලයි.

2) සාපෙක්ෂ මිල
   - භාණ්ඩවල මිල ගණන් අතර අනුපාතය සාපේක්ෂ මිලයි.
   - එනම් එක් භාණ්ඩයක මිල වෙනත් භාණ්ඩයක මිලෙන් ප්‍රකාශ කිරීමයි.

3) පොදු මිල මට්ටම / සාමාන්‍ය මිල
   - ආර්ථිකයේ සියලුම භාණ්ඩ හා සේවාවන්ගේ නිරපේක්ෂ මිල ගණන් වල සාමාන්‍ය අගය පොදු මිල මට්ටමයි.

- **උද්ධමනය. අවධමනය හා නිරුද්ධමනය යන සංකල්ප අතර වෙනස**

  - **උද්ධමනය**
    - සාමාන්‍ය මිල මට්ටමේ හටගන්නා අඛණ්ඩ ඉහළ යාම උද්ධමනයයි.

  - **අවධමනය**
    - සාමාන්‍ය මිල මට්ටමේ හටගන්නා අඛණ්ඩ පහළ යාම අවධමනයයි.

  - **නිරුද්ධමනය**
    - උද්ධමන අනුපාතිකයේ අගය ක්‍රමයෙන් පහළ යාම නිරුද්ධමනයයි.

- **උද්ධමනයට හේතු පැහැදිලි කරන න්‍යායන් 2යි.**

1. ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය
2. පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමනය

❖ ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය

- සමාහාර සැපයුම ට සාපේක්ෂව සමාහාර ඉල්ලුම ඉහළ යාම නිසා පොදු මිල මට්ටම ඉහළ යාම ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනයයි.
- ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය හටගැනීමට මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යටතේ අනුගමනය කරන ක්‍රියා මාර් ග ඉවහල් වේ.
  - පොලී අනුපාත පහළ දැමීම
  - ව්‍යවස්ථාපිත සංචිත අනුපාත අඩු කිරීම
  - මහබැංකුව වාණිජ බැංකු සමඟ ප්‍රති විකුණුම් ගිවිසුම් වලට එළඹීම යනාදිය මූල්‍ය ප්‍රතිපත්ති යටතේ සමාහාර ඉල්ලුම ඉහළ යාමට හේතු වේ.
  - රජයේ වියදම් ඉහළ දැමීම
  - බදු කපා හැරීම
  - සහනාධාර ලබාදීම

යනාදිය තුළින් සමාහාර ඉල්ලුම ඉහළ යාමෙන් උද්ධමනයක් ඇතිවේ.

- ඉහත සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කරන විට ණය සැපයුම. මුදල් සැපයුම. වැයකල හැකි ආදායම සහ සමාහාර ඉල්ලුම යන සාර්ව ආර්ථික විචල්‍යයන් මත ඇති කරන බලපෑම් මත මිල මට්ටමේ හැසිරීම් තීරණය වේ.

- ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය පැහැදිලි කිරීමට භාවිතයේ ඇති න්‍යායන් දෙකක් තිබේ.

1. මුදල් ප්‍රමාණවාදී විග්‍රහය
2. කේන්සියානු න්‍යාය විග්‍රහය

❖ **මුදල් ප්‍රමාණවාදී න්‍යාය**

- රටක මුදල් තොගය වෙනස් වීම හා මිල මට්ටම වෙනස්වීම අතර ඍජු හා සමානුපාතික සම්බන්ධතාව මුදල් ප්‍රමාණවාදී විග්‍රහයෙන් පෙන්වාදෙයි.

- මෙය පැහැදිලි කිරීමට මුදල් ප්‍රමාණවාදීන් විනිමය සමීකරණය යොදා ගනී.
- විනිමය සමීකරණය M V = PT ලෙස දැක්විය හැකිය.

m= මුදල් තොගය V= මුදලේ සංසරණ ප්‍රවේගය

P=පොදු මිලමට්ටම,

T=ගනුදෙනු ප්‍රමාණය හෙවත් මූර් ත දළ දේශීය නිෂ්පාදිතයයි.

- ගණුදෙනු ප්‍රමාණය මත ආදායම තීරණය වෙන බැවින් පසු කාලයේ දී T වෙනුවට y ආදේශ කර විනිමය සමීකරණය m v = p y ලෙස පෙන්වාදී තිබේ.

- විනිමය සමීකරණය සාවර් සාමාන්‍යයක් වේ. ඒනම් සැබැවින්ම අනන්‍යතාවයකි.

- py හෙවත් PT වලින් පෙන්නුම් කරන්නේ නාමික දළ දේශීය නිෂ්පාදිතයයි.

- mv යනු මුදල් යොදා සිදු කළ ගනුදෙනු ප්‍රමාණයයි.

- මුදලේ සංසරණ ප්‍රවේගය යනු ගනුදෙනු සඳහා මුදල් ඒකකයක් අතිනත හුවමාරු වන වාර ගණනයි.

- විනිමය සමීකරණය තුළ ඇතුළත් v සහ y ස්ථාවර යැයි උපකල්පනය කළ විට m ඉහළ යන ප්‍රමාණයට සමානුපාතිකව p ඉහළ යන බව මුදල් ප්‍රමාණ ප්‍රමාණවාදී න්‍යාය පෙන්වාදෙයි.

❖ උද්ධමනය පිළිබඳ කේන්සියානු විග්‍රහය

- ආර් ථිකය පූර් ණ සේවා නියුක්ති මට්ටම කරා ළඟා වූ විට තවදුරටත් සමාහාර වියදමේ සංරචක ඉහළ යාමෙන් සාමාන්‍ය මිල මට්ටම ඉහළ ගොස් උද්ධමනයක් හටගන්නා බව මෙම න්‍යායන් පවසයි.

- එය පහත ප්‍රස්ථාරය මගින් ඉදිරිපත් කිරීමට හැකිය.



- YF පූර් ණ සේවා නියුක්ති ආදායම් මට්ටම වන අතර. එම මට්ටමට ආර් ථිකය ළඟා වූ පසු තවදුරටත් නිමවුම වැඩි කිරීමට හැකියාවක් නැත. සමාහාර ඉල්ලුම තව තවදුරටත් ඉහළ ගිය විට මිල මට්ටම ඉහළ ගොස් උද්ධමනයක් ඇතිවේ.

- ❖ **පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය**

  - භාණ්ඩ හා සේවා වල යෙදවුම් පිරිවැය ඉහළ යෑමෙන් පොදු මිල මට්ටම ඉහළගොස් උද්ධමනයක් ඇති වන බව මෙම ප්‍රවේශයෙන් පෙන්වාදෙයි.
  - ජාතික ආදායමේ කොටස් අල්ලා ගැනීමට බලපෑම් කණ්ඩායම් සිදු කරන අරගල වල ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය මිල මට්ටම ඉහළ යයි.
  - මෙහි බලපෑම් කණ්ඩායම් ලෙස හඳුනාගන්නේ පහත් සඳහන් කණ්ඩායම් ය.
    - ශක්තිමත් වෘත්තිය සමිති.
    - කතිපයාධිකාරි ආයතන.
  - පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කළ හැකිය.



❖ මූලික උද්ධමනය හා මතුපිට උද්ධමනය.

- මතුපිට උද්ධමනය යනු උද්ධමනය මැනීමට යොදා ගන්නා දශර්කයට කිසිදු ගැලපීමක් සිදු නොකර එහි ඇතුළත් භාණ්ඩ පැසෙහි මිල ගණන් වල වෙනස් වීම අනුව ගණනය කළ විට ලැබෙන දශර්කයේ අගය ඉහළ යාම නිසා හටගන්නා උද්ධමනයයි.

- මූලික උද්ධමනය යනු දශර්කය තුළ ඇතුළත් මිල කම්පන හටගත් භාණ්ඩ හා සේවා දශර්කයෙන් ඉවත් කළ පසු ගණනය කිරීමෙන් දශර්කයේ අගය ඉහළ යාම නිසා හටගන්නා උද්ධමනයයි.

- ශ්‍රී ලංකාවේ මූලික උද්ධමනය ගණනය කිරීමේ දී පහත සඳහන් ක්ෂේත්‍ර වල භාණ්ඩ දශර්කය දශර්කයෙන් ඉවත් කරයි.

  - අනවශ්‍ය ආහාර ද්‍රව්‍ය
  - ඉන්ධන මිල ගණන්
  - ප්‍රවාහන සේවා මිල ගණන්

❖ **උද්ධමන අනුපාතිකයේ වේගය අනුව උද්ධමනය වගර් කිරීම**

1. **මධ්‍යස්ථ උද්ධමනය**
   - වාර් ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය තනි ඉලක්කමේ අගයක් ගන්නා විට එවැනි උද්ධමනකාරී තත්ත්වයක් මධ්‍යස්ථ උද්ධමනය ලෙස හඳුන්වයි. සාමාන්‍යයෙන් 4% 5% වැනි උද්ධමන ත්ත්වයක් පැවැත්වීම මධ්‍යස්ථ උද්ධමනයයි.

   - සාමාන්‍ය උද්ධමනයක් පවතින විට මුදලේ මූර් ත අගය ක්ෂය වීම එතරම් බරපතළ නොවේ.

2. **ජවන උද්ධමනය**
   - වාර් ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය 10% 20% 50% වැනි ඉලක්කම් දෙකේ අගයක් ගන්නා විට එවැනි තත්ත්වයක් ජවන උද්ධමනය ලෙස හඳුන්වයි.

   - මෙවැනි උද්ධමනයක් පවතින විට මුදලේ අගය පහළ යන බැවින් මිනිසුන් මුදල් ශෙෂ වශයෙන් ළග තබා නොගනී.

3. අත්‍යුද්ධමනය

- මාසික සාමාන්‍ය උද්ධමනය අනුපාතිකය ඉලක්කම් දෙකේ අගයක් ගන්නා විට , එවැනි උද්ධමනයක් හැදින්වීමට අත්‍යුද්ධමනය යන වචනය භාවිතා කරයි.

- මෙවැනි උද්ධමනයක් පවතින විට මුදලේ මූර් ත අගය වේගයෙන් පහළ යයි. මිනිසුන් මුදල් , මුදල් ලෙස ලග තබා නොගන්නා අතර මූතර් වත්කම් වශයෙන් මුදල් ලග තබා ගැනීමට පෙළඹේ

❖ උද්ධමනයේ ආර් ථික ප්‍රතිවිපාක

- ආදායම් ව්‍යාප්තිය අයහපත් වීම
- තීරණ ගැනීමේ ක්‍රියාවලිය විකෘති වීම
- ණයහිමියන්ට වාසිදායක වීම
- ණය ගැතියන්ට අවාසිදායක වීම
- ඉතිරි කරන්නන් ගේ මූර් ත පොලී අනුපාතිකය පහළ යාම
- නාමික ආදායමේ මූර් ත අගය පහළ යාම
- ඵලදායි ආයෝජනවලින් ඵලදායි නොවන ආයෝජන කර සම්පත් මාරුවීම
- ජීවන වියදම ඉහළයාම

- සපත්තු සම් පිරිවැය හා මෙනුපත් පිරිවැයක් ඇතිවීම
- නිරපේක්ෂ දරිද්‍රතාව ඉහළ යාම
- විනිමය අනුපාතිකය ක්ෂය වීම
- අපනයන තරගකාරීතවයට බාධා ඇතිවීම

❖ උද්ධමනය පාලනය කිරීමේ යෝග්‍ය ප්‍රතිපත්ති

- සමාහාර ඉල්ලුමේ වර්ධනය සීමා කිරීම. (මූල්‍ය ප්‍රතිපත්තියට හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හැසිරවීම)
- සමාහාර සැපයුමේ වර්ධනය වේගවත් කිරීම.
- ඍජු රාජ්‍ය මැදිහත්වීම. (මිල පාලන හා ආදායම් පාලන ප්‍රතිපත්ති යොදාගැනීම)
- කාර්යක්ෂමව සම්පත් බෙදාහැරීමේ බාධක ඉවත් කිරීම.

❖ **ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීමට යොදා ගන්නා මිල දර්ශක**

- කොළඹ පාරිභෝගික මිල දර්ශකය
- ජාතික පාරිභෝගික මිල දර්ශකය
- නිෂ්පාදකයාගේ මිල දර්ශකය
- දළ දේශීය නිෂ්පාදිතය අවධමනය

❖ **කො.පා. මිල දර්ශකයේ හා ජා.පා. මිල දර්ශකය සැසඳීම.**

අයිතමය	ජා.පා. මිල දර්ශකය	කො.පා. මිල දර්ශකය
01.පදනම් වර්ෂය	2013	2013
02. දර්ශකයට පදනම් සමීකරණය	2012/2013 ගෘහ ඒකක ආදායම්,වියදම් සමීක්ෂණය	2012/2013 ගෘහ ඒකක ආදායම්,වියදම් සමීක්ෂණය
03. ආවරණය වන භූගෝලීය ප්‍රදේශ	සෑම පළාතකම සියලු ගෘහ ඒකක	කොළඹ නාගරික කලාප වල ගෘහ ඒකක
04. පදනම් කාලසීමාවේ මාසික පරිභෝජන වියදම	රු. 32142.69	රු. 60364.73
05. එක් දර්ශක අංකයක වටිනාකම	රු. 321.42	රු. 603.65
06. භාණ්ඩ පැසෙහි අයිතම සංඛ්‍යාව		
- ප්‍රධානභාණ්ඩ බාණ්ඩ	12	12
- උප බාණ්ඩ	105	105
	407	392
07. අන්තර්ගත භාණ්ඩ හා සේවා සංඛ්‍යාව		
08. බර තැබීම	44.04 %	28.24 %
- ආහාර	55.96 %	71.76 %
- ආහාර නොවන		
	ඒක් දිස්ත්‍රික්කයක ප්‍රධාන නගරයෙ මධ්‍යස්ථාන 3 බැගින්	කොළඹ නාගරික ප්‍රදේශයේ මධ්‍යස්ථාන 14 ක්

- ❖ **නිෂ්පාදකයාගේ මිල ද දශර්කය**
  - 2015 වෂර්යේ ජනලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාතර්මේන්තුව මෙම දශර්කය සකස් කර ඇත.
  -
  - නිෂ්පාදකයන්ගේ භාණ්ඩ හා සේවා සඳහා ලබන සාමාන්‍ය මිල ගණන් වල විචලනය මෙම දශර්කය මගින් මනිනු ලැබේ
  - පාරිභෝගික මිල දශර්කය මගින් තෝරාගත් භාණ්ඩ හා සේවා මිල ගණන් වල වෙනස්වීම් සිදු කරන අතර මෙම දශර්කයෙන් සමස්ත මිල ගණන් වල වෙනස්වීම් නිරූපණය කරයි.
  - ආර් ථික ප්‍රතිපත්ති සම්පාදකයන්ට වැදගත් දශර්කයකි.
  - 1974 මහබැංකුව සකස් කළ තොග මිල දශර්කය වෙනුවට නිෂ්පාදකයාගේ මිල දශර්කය වතර්මානයේ යොදා ගනී.
  - නිෂ්පාදන අදියරේ දී හටගන්නා මිල විචලනයන් වෙළෙඳපොළ කරා පතිත වෙන බැවින් වෙළෙඳපොළ මිල ගණන් පිළිබඳ කල්තියා පුරෝකතන ලබාගැනීමට නිෂ්පාදකයන්ගේ මිල දශර්කය ප්‍රයෝජනවත් වේ.
  - මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී මෙම දශර්කය වැදගත් වේ
  - ආයෝජකයන්ට මූල්‍ය ප්‍රවාහ මගින් උපයා ගත හැකි ලාභ පිළිබද ඇස්තමේන්තු කල්තියා සකසා ගැනීමට වැදගත් වේ.
  - මුල් අදියරේ දී කෘෂි කමර්ාන්ත හා විදුලිය හා ජලය වෙනි උපයෝගීතා සැලකිල්ලට ගෙන ඇති අතර. පසු අදියරක දී සේවා අංශය සම්බන්ධ කර ගැනීමටත් අපේක්ෂා කරයි.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් නිකුත් කළ නිෂ්පාදක මිල දර්ශක අත්පොත් අනුව ලංකාවේ නිෂ්පාදකයාගේ මිල ද දර්ශකය සකස් කෙරේ.

❖ **දළ දේශීය නිශ්පාදිතයේ අවධමනකය**

- ගම්‍ය මිල දර්ශකය ලෙසත් ආරෝපිත මිල දර්ශකය ලෙසත් මෙම දර්ශකය හඳුන්වයි.

- දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් භාණ්ඩ හා සේවාවල මිල මගින් ඇතිකල බලපෑම් මෙම දර්ශකය මගින් ඉවත් කරයි.

- පහත සඳහන් ආකාරයට ගණනය කිරීම සිදු කරයි.

$$\text{දළ දේශීය නිශ්පාදිතයේ අවධමනකය} = \frac{\text{වර් තන මිල මත දළ දේශීය නිෂ්පාදිතය}}{\text{ස්ථාවර මිල මත දළ දේශීය නිෂ්පාදිතය}} \times 100$$

- දර්ශකයේ පාදක වෂර්ය 2010 වේ.

❖ උද්ධමන අනුපාතිකය ගණනය කරන ආකාරය

- සමස්ත මිල මට්ටමේ ප්‍රතිශතාත්මක වෙනස උද්ධමන අනුපාතිකය වේ .

- උද්ධමන අනුපාතිකය ආකාර තුනකින් ගණනය කරයි.

1. මාසික උද්ධමන අනුපාතිකය
   - අනුයාත මාස දෙකක් අතර මිල දර්ශක වල ප්‍රතිශතක වෙනස

$$= \frac{\text{සලකා බලන මාසයේ මිල දර්ශකයේ අගය} - \text{පෙර මාසයේ දර්ශකයේ අගය}}{\text{පෙර මාසයේ දර්ශකයෙ අගය}} \times 100$$

2. ලක්ෂ්‍යමය පදනම මත උද්ධදමන අනුපාතිකය.
   - අනුරූප කාල පරිච්ඡේද දෙකක් අතර මිල දර්ශකවල ප්‍රතිශතාත්මක වෙනස.

= මෙම වර්ෂයේ සළකා බලන මාසයේ - පෙර වර්ෂයේ එම මාසයේ

$$\frac{\text{මිල දර්ශකයේ අගය} \qquad \text{මිල දර්ශකයේ අගය}}{\text{පෙර වර්ෂයේ එම මාසයේ දර්ශකයේ අගය}} \times 100$$

3. වාර් ෂික සාමාන්‍ය පදනම මත උද්ධමනය අනුපාතිකය

- සලකා බලන මාසය ඇතුළත් මාස 12ක මිල දර්ශක වල සාමාන්‍ය සහ ඊට පෙර මාස 12ක මිල දර්ශක වල සාමාන්‍ය අතර ප්‍රතිශතාත්මක වෙනස

නිපුණතා මට්ටම 7.5 : ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තියේ කාර්යභාරය විමසයි .

- මූල්‍ය පද්ධතියක් යනු ආර්ථික ඒකක වල මූල්‍ය තීරණ ක්‍රියාත්මක වන සංඝටක රාශියකින් සැදුම්ලත් ව්‍යුහයකි.

- **මූල්‍ය පද්ධතියේ සංරචක**
    - මූල්‍ය ආයතන
    - මූල්‍ය වෙළෙඳපොළ
    - මූල්‍ය උපකරණ
    - මූල්‍ය යටිතල පහසුකම්
    - මූල්‍ය ආයතන නියාමනය හා අධීක්ෂණය

- **මූල්‍ය ආයතන**
    - මූල්‍ය උපකරණ භාවිතයෙන් මූල්‍ය ගණුදෙනු කරන විවිධ ආයතන මූල්‍ය ආයතන වේ.
    - ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන ව්‍යුහය කොටස් හතරකි.
        - ශ්‍රී ලංකා මහ බැංකුව
        - අතරමැදි මූල්‍ය ආයතන
        - මූල්‍ය සේවා සපයන ආයතන
        - මූල්‍ය අධීක්ෂණය හා නියාමන ආයතන

- **අතරමැදි මූල්‍ය ආයතන**
    - අතිරික්ත මුදල් තැන්පතු ලෙස ලබාගෙන අරමුදල් අවශ්‍ය ඒකක වෙත ලබා දෙමින් ලාභ උපයන ආයතන.
        - තැන්පතු භාර ගනිමින් බැංකු කටයුතු කිරීමට අවසර ලබා ඇති ආයතන
        - අර්ථසාධක හා විශ්‍රාම අරමුදල
        - රක්ෂණ සමාගම්
        - ආයෝජන සමාගම්
        - ඒකක භාර
        - කල්බදු සමාගම්

- **තැන්පතු භාර ගෙන බැංකු කටයුතු කිරීමට අවසර ලබා ඇති ආයතන**
    - බලපත්‍රලාභී වාණිජ බැංකු
    - බලපත්‍රලාභී විශේෂිත බැංකු
    - ලියාපදිංචි මූල්‍ය සමාගම්
    - සමුපකාර ග්‍රාමීය බැංකු
    - සකසුරුවම් හා ණය ගණුදෙනු සමුපකාර සමිති
    - වෙනත් ණය දෙන සමුපකාර සමිති

- **මූල්‍ය සේවා සපයන ආයතන**
    - වණිජ බැංකු
    - අරමුදල් කළමනාකරණ ආයතන
    - මූල්‍ය තැරැව්කාර ආයතන
    - ආණ්ඩුවේ සුරකුම්පත් පිළිබඳ ප්‍රාථමික වෙළඳුන්

- **මූල්‍ය අධීක්ෂණ හා නියාමන ආයතන**
    - මහ බැංකුව
    - සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
    - ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

- **මහ බැංකු වාතර්ාවේ සඳහන් මූල්‍ය ආයතන**
    - මහ බැංකුව
    - බලපත්‍රලාභී වාණිජ බැංකු
    - බලපත්‍රලාභී විශේෂිත බැංකු
    - තැන්පතු භාර ගන්නා අනෙකුත් විශේෂිත ආයතන
    - බලපත්‍රලාභී මුදල් සමාගම්
    - සමුපකාර හා ණය ගණුදෙනු සමුපකාර සමිති

- **විශේෂිත මූල්‍ය ආයතන**
  - විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්
  - ප්‍රාථමික අලෙවිකරුවන්
  - කොටස් තැරැව්කරුවන්
  - ඒකකභාර කළමනාකරණ සමාගම්
  - ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්
  - වෙළෙඳපොළ අතරමැදියන්
- **ගිවිසුම්ගත ඉතිරිකිරීමේ ආයතන**
  - රක්ෂණ සමාගම්
  - සේවක අර්ථසාධක අරමුදල
  - සේවක භාරකාර අරමුදල
  - අනුමත විශ්‍රාම හා අර්ථසාධක අරමුදල
  - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

- **මූල්‍ය වෙළෙඳපොළ**
  - කෙටිකාලීන හා දිගුකාලීන අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීමට මූල්‍ය උපකරණ විකිණීම හා මිලදී ගන්නා වෙළෙඳපොළ මූල්‍ය වෙළඳපොලයි.
  - මූල්‍ය වෙළෙඳපොළ අංශ 2යි
    1. මුදල් වෙළෙඳපොළ
    2. ප්‍රාග්ධන වෙළෙඳපොළ
- **මුදල් වෙළෙඳපොළ**
  - වසරකට වඩා අඩු කාලයකින් කල්පිරෙන මූල්‍ය උපකරණ හුවමාරු වෙන වෙළෙඳපොළ මුදල් වෙළඳපොලයි.
    උදා : භාණ්ඩාගාර බිල්පත් , වාණිජ පත්‍රිකා
  - මුදල් වෙළඳපොළේ උප වෙළඳපොළවල්
    - අන්තර් බැංකු ඒක්ෂණ ණය අරමුදල් වෙළෙඳපොළ
    - භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ
    - වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ
    - අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොළ

- ❖ **අන්තර් බැංකු ඒක්ෂණ අරමුදල් වෙළඳපොළ**
  - වාණිජ බැංකු සිය දෛනික ද්‍රව්‍යශීලතා සපුරාගන්නා වෙළෙඳපොළ අන්තර් බැංකු ඒක්ෂණ අරමුදල් වෙළඳපොලයි.
  - ඌණ ද්‍රව්‍යශීලතා පවතින වාණිජ බැංකු අධි ද්‍රව්‍යශීලතා ඇති වාණිජ බැංකුවලින් දිනකින් ගෙවීම සඳහා ණය ලබා ගැනීම මෙහිදී සිදු වේ.
  - මෙම වෙළඳපොළ ණය සඳහා ඇති ඉල්ලුම හා සැපයුම අනුව පොලී අනුපාතය තීරණය වේ.
- ❖ **භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ**
  - රජය කෙටි කාලීන ණය අරමුදල් සපයා ගන්නා එක් වෙළඳපොළකි භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ.
  - දින 90; දින 180; දින 364 න් කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සිදුවේ.
  - නිකුත් කරන අවස්ථාවේ ඒවා මිලදී ගන්නේ ප්‍රාථමික වෙළඳුන් වන අතර එය ප්‍රාථමික වෙළඳපොලයි.
  - ද්විතීක වෙළෙඳපොළේ දී ප්‍රාථමික වෙළෙඳුන්ගෙන් අනෙකුත් මූල්‍ය ආයතන වලට හෝ පුද්ගලයන්ට මිලදී ගැනීමටත්. හුවමාරු කර ගැනීමටත් හැකිවේ.

- **වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ**
  - ව්‍යාපාරික ආයතන කෙටිකාලීන අරමුදල් සපයා ගැනීමට වාණිජ පත්‍රිකා නිකුත් කරයි.

- **අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොළ**
  - විදේශ විනිමය මිලදී ගැනීම හා විකිණීම ආශ්‍රිත වෙළෙඳපොළ අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොළය.

- **ප්‍රාග්ධන වෙළෙඳපොළ**
  - වසරකට වඩා වැඩි කාලයකින් කල්පිරෙන මූල්‍ය උපකරණ හුවමාරු වන වෙළෙඳපොළ ප්‍රාග්ධන වෙළෙඳපොළයි.
    උදා : කොටස් වෙළෙඳපොළ , භාණ්ඩාගාර බිල්පත් , වෙළෙඳපොළ සඳහා ණයකර වෙළෙඳපොළ

❖ ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ තුළ හුවමාරු වෙන මූල්‍ය උපකරණ

- රජය නිකුත් කරන මූල්‍ය උපකරණ
  - හාණ්ඩාගාර බිල්පත්
  - හාණ්ඩාගාර බැඳුම්කර
  - රජයේ ණය සුරකුම්පත්
- සමාගම් නිකුත් කරන ණය උපකරණ
  - වාණිජ පත්‍රිකා
  - ණයකර
- වාණිජ බැංකු අරමුදල් සපයා ගන්නා උපකරණ
  - තැන්පතු සහතික
  - වත්කම් පදනම් කරගත් සුරකුම්පත්
  - කල්බදු හෙවත් කුලීපිට ගැනුම්
  - ඒක්ෂණ ණය
  - ව්‍යාපාරික කොටස්

❖ ණය ශ්‍රේණිගත කිරීම

- මූල්‍ය වෙළඳපලේ මූල්‍ය උපකරණ වල ආයෝජනය කරන ආයෝජකයින්ට එම උපකරණ වල ගුණාත්මක තත්ත්වය හඳුනා ගනිමින් තේරීම් කිරීමට මඟ පෙන්වීමක් ලෙස ණය ශ්‍රේණිගත කිරීම හඳුන්වා දී ඇත.
- ණය ශ්‍රේණිගත කිරීම තුළින් ණය උපකරණ සහ ඒවා නිකුත් කරන ආයතන වල මූල්‍ය ශක්තිය පිළිබඳවත් නිකුත් කරන්නාට එය පවත්වාගෙන යාමේ හැකියාව හා පියවීමට ඇති හැකියාව පිළිබඳ තක්සේරුවක් කරයි.

❖ ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන

- මූඩීස් සමාගම
- ස්ටෑන්ඩඩර් හා පුවසර් සමාගම
- ෆිට් සමාගම

නිපුණතා මට්ටම 7.6 : ශ්‍රී ලංකා මහා බැංකුවේ අරමුණු හා කාර්යයන් විමසයි

ශ්‍රී ලංකා මහ බැංකුව

- 1949 අංක 58 දරන මුදල් නීති පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව 1950 අගෝස්තු 28 වන දින ආරම්භ කරන ලදී.

- ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම , මූල්‍ය කටයුතු සඳහා උපදේශන සේවා සැපයීම , ආර්ථික හා මිල ස්ථාපිතව මෙන්ම මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාවය පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ස්වාධීන ආයතනයක් ලෙස පිහිටුවන ලදී.

- වර්තමාන ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු
  - ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වා ගෙන යාම
  - මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වා ගෙනයාම

- සාර් ආර්ථික විචල්‍යයන් අනපේක්ෂිත අයුරින් දෝලනය වීම වලක්වා ගනිමින් ආර්ථික හා මිල ස්ථායිතාව ඇතිකර ගැනීමට මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙය වීමට විවිධ උපකරණ භාවිත කරයි.

- අභ්‍යන්තර හා බාහිර කම්පන හමුවේ ශක්තිමත් මූල්‍ය ආයතන පද්ධතියක් පවත්වාගෙන යාම මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවයි.

- ශ්‍රී ලංකා මහා බැංකුවේ කාර්යයන්
  - මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම
  - විනිමය අනුපාතික ප්‍රතිපත්තිය මෙහෙයවීම
  - ව්‍යවහාර මුදල් නිකුත් කිරීම
  - නිල විදේශ සංචිත කළමනාකරණය කිරීම
  - වාණිජ බැංකු විශේෂිත බැංකු මූල්‍ය සමාගම් හා ප්‍රාථමික වෙළෙඳුන්ට කටයුතු කරගෙන යාමට බලපත්‍ර නිකුත් කිරීම.
  - රජයේ බැංකුකරු ආර්ථික උපදේශක හා මූල්‍ය නියෝජිතයා ලෙස කටයුතු කිරීම.
  - රාජ්‍ය ණය කළමනාකරණය කිරීම.
  - කුඩා පරිමාණ මූල්‍යකරණ වැඩසටහන් සහ ග්‍රාමීය ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

- **මූල්‍ය ප්‍රතිපත්තිය**
  - මූල්‍ය ප්‍රතිපත්තිය යනු මිල හා ආර්ථික ස්ථායිතාව පවත්වා ගෙන යාමට මුදල් සැපයුම හා පොලී අනුපාතිකය හැසිරවීමේ ප්‍රතිපත්තියයි.
  - මේ සඳහා මූල්‍ය උපකරණ ක්‍රියාත්මක කරයි.

- **මූල්‍ය ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධාන අරමුණු 2යි.**

1. මුදල් ඉලක්කකරණය
2. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය

- ඉහත ද්විත්වය ඉලක්කකර මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන අතර 2020 සිට මුදල් ඉලක්කකරණය ඉවත් කර නම්‍යශීලී උද්ධමන ඉලක්කකර ප්‍රතිපත්තිය හසුරුවනු ලබයි.

- නම්‍යශීලි උද්ධමනයක් ඉලක්කකර මූල්‍ය ප්‍රතිපත්තිය ප්‍රධාන උපකරණ 2ක් ඔස්සේ ඉලක්ක 3ක් සපුරා ගැනීමට උත්සාහ ගනී.

  - ප්‍රමාණාත්මක ණය උපකරණ
  - ගුණාත්මක ණය උපකරණ

3 අවසාන ඉලක්කය

ආර්ථික හා මිල ස්ථායිතාව

2. අතරමැදි ඉලක්කය

ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම

m_2b

1.මෙහෙයුම් ඉලක්කය

හරිත සාමාන්‍ය ඒක්ෂණ අනුපාත

මූල්‍ය උපකරණ

-ප්‍රතිපත්ති පොළී අනුපාතික මෙහෙයවීම.

- විචල්‍ය සංචිත අනුපාත වෙනස් කිරීම

- විවිට වෙළඳපොළ කටයුතු

- මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව වතර්මානයේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හා විවිධ වෙළෙඳපොළ කටයුතු පිළිබඳ දැඩි විශ්වාසයක් තබා තිබේ.

- නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය යනු ඉලක්ක කළ උද්ධමන අනුපාතික ආසන්නයේ, උද්ධමනය පවත්වා ගනිමින් මූර් ත ආර්ථිකය ද ස්ථායි කර ගැනීමයි.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන මෙම වැඩිදියුණු කළ මූල්‍ය ප්‍රතිපත්ති රාමුව යටතේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය විනිමය අනුපාතිකය කළමනාකරණයේ නම්‍යශීලීත්වයට සහාය දෙන අතරම මැදි කාලීනව උද්ධමනය මැද තනි අගයක පවත්වා ගැනීමට හේතුවේ.

- පසුගිය වසර කිහිපයේ ඉලක්ක කළ උද්ධමනයෙ මැද තනි අගය 4% ත් 6% අතර අගයක් විය.

❖ **ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ**

- මේ යටතේ උපකරණ තුනක් භාවිතා කරයි.
  1. මහ බැංකු පොලී අනුපාතිකය
  2. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය
  3. විවිධ වෙළෙඳපොළ කටයුතු
- මහ බැංකු පොලී අනුපාතය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රියාත්මක කරයි.

- ප්‍රතිපත්ති පොලී අනුපාතික දෙකක් තිබේ.
  1. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය
  2. නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය

- අන්තර් බැංකු ඒක්ෂණ අරමුදල් වෙළෙඳපොලේ පොලී අනුපාත විචලනය වන්නේ ද්‍රව්‍යශීලතාව වෙනස්වීම මතය.

- අධි ද්‍රව්‍යශීලතාවක් මූල්‍ය වෙළෙඳපොළේ පවතින විට පොලී අනුපාත පහළ යන අතර එය පාලනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය යොදාගනී.

- අන්තර් බැංකු ඒක්ෂණ අරමුදල් වෙළෙඳපොළේ පොලී අනුපාත පහළ යාම නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය නිසා පාලනය වන බැවින් මහ බැංකු පොලී අනුපාත කොරිඩෝවේ පහල සීමාව නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතයයි.

- මූල්‍ය වෙළඳපලේ ඌණ ද්‍රව්‍යශීලතාවක් පවතින විට අන්තර් බැංකු ඒක්ෂණ අරමුදල් වෙළඳපොලේ පොලී අනුපාතය ඉහළ යයි. එය පාලනය කිරීමට මහ බැංකුව නිත්‍ය ණය පහසුකම් අනුපාතය හසුරුවනු ලබයි. ඌණ සංචිත පවතින වාණිජ බැංකු වලට මෙම අනුපාතිකය යටතේ ණය ලබා ගැනීමට හැකියාවක් පවතී.

- මේ නිසා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය මහ බැංකු පොලී අනුපාත කොරිඩෝව ඉහළ සීමාව ලෙස සලකයි.

ඒක්ෂණ අරමුදල් වෙළඳපොළේ පොලී අනුපාත විචලනය ඉහත අනුපාත දෙක අතර දෝලනය වීමට සැලැස්වීමෙන් පොලී අනුපාතිකය වෙනස් වීම පාලනය කර ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වා ගැනීමට කටයුතු කරයි.

- නිත්‍ය තැන්පතු පහසුකම් හා නිත්‍ය ණය පහසුකම් අනුපාත වල මධ්‍ය අගය හරිත සාමාන්‍ය ඒක්ෂණ අනුපාතිකයයි. එය මූල්‍ය ප්‍රතිපත්තියේ මෙහෙයුම් ඉලක්කයයි.

- බරිත සාමාන්‍ය ඒක්ෂණ අනුපාතිකය ඉලක්ක කර; ඉහත ප්‍රතිපත්ති පොලී අනුපාත වරින් වර වෙනස් කරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ නවාශීලී උද්ධමන ඉලක්කකරණය සාර්ථක කරගැනීම සඳහාය.

❖ **ව්‍යවස්ථාපිත සංචිත අනුපාත නියම කිරීම**

- වාණිජ බැංකු විසින් මහ බැංකුවේ නියමයන් ට අනුව තමත් වෙන ගලා එන තැන්පතු වලින් මහ බැංකුව නියම කරන ප්‍රතිශතයක් පවත්වා ගත යුතුය. මෙම අනුපාතය ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ලෙස හඳුන්වයි.

- එම අනුපාතය වරින් වර ඉහළ පහළ දමමින් වාණිජ බැංකුවල ණය සැපයුම පාලනය කරයි.

❖ **විවිධ වෙළෙඳපොළ කටයුතු**

- ප්‍රති මිලදී ගැණුම් ගිවිසුම් යටතේ මහ බැංකුව සතු බිල්පත් අලෙවි කරන විට වාණිජ බැංකුවල සංචිත පහළ ගොස් ණය සැපයුම සීමාවේ.

- ප්‍රති විකුණුම් ගිවිසුම් මගින් වාණිජ බැංකුවල බිල්පත් මහ බැංකුව මිලදී ගන්නා විට වාණිජ බැංකුවල සංචිත ඉහළ ගොස් ණය සැපයුම ප්‍රසාරණය වේ.

- ප්‍රමාණාත්මක ණය පාලන උපකරණ භාවිත කිරීමෙන් මහ බැංකුව අපෙක්ෂා කරන්නේ සමස්ත මුදල් සැපයුම පාලනය කිරීම තුලින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සාර් ථක කරගනිමින් මිල හා ආර් ථික ස්ථායිතාව ඇතිකර ගැනීමයි.

❖ **ගුණාත්මක ණය පාලන උපකරණ**

ආර් ථිකයේ ණය පරිමාව හා ණය ගලායන දිසාව පාලනය කිරීමට මහ බැංකුව යොදා ගන්නා උපකරණ ගුණාත්මක ණය පාලන උපකරණයි.

- ගුණාත්මක ණය පාලන උපකරණ
  - ණය ශීෂර් පිළිබඳ උපරිම සීමා නියම කිරීම්
  - යහ පෙළඹුම්
  - වණර්නාත්මක පොලී අනුපාත නියම කිරීම්
  - ඇප සුරකුම් වෙනස් කිරීම
  - බැංකු ණය පාලනය කිරීම

නිපුනණතා මට්ටම 7.7 : වාණිජ බැංකුවක කාර්යභාරය විමසයි.

❖ **වාණිජ බැංකු අර්ථ දැක්වීම**

- වාණිජ බැංකුවක් යනු චෙක්පතකින් හෝ විධානයකින් හෝ අන්‍ය ආකාරයකින් ඉල්ලූ විට ආපසු ගෙවීමේ පොරොන්දුවට යටත්ව මහජනයාගේ තැන්පතු භාර ගනිමින් ලාභ ඉපයීම අරමුණු කරගෙන මූල්‍ය අතරමැදි කරණයේ යෙදෙන මූල්‍ය ආයතන විශේෂයයි.

❖ **වාණිජ බැංකුවක අරමුණු**

- ද්‍රව්‍යශීලතා අරමුණු
- ලාභදායිතා අරමුණ

- තැන්පත්කරුවන් ඉල්ලූ ඕනෑම විටක ආපසු ගෙවීමට ප්‍රමාණවත් සංචිත පවත්වාගෙන යාමට සිදු වේ. එසේ නොවුණහොත් ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය පලුදු වේ.මෙය ද්‍රවශීලතා අරමුණයි.

- ලාභදායිතා අරමුණ යනු ලාභ ලැබීම සඳහා අරමුදල් ආයෝජන කටයුතුවල යෙදවීමයි. වාණිජ බැංකුවේ පැවැත්ම රඳා පවතින්නේ ලාභදායීතාවය මතය.

- වාණිජ බැංකුවක ඉහත අරමුණු දෙක එකිනෙකට ගැටෙන සුළුය. එක් අරමුණක් කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම අනික් අරමුණට හානිවේ. මේ නිසා වාණිජ බැංකු මෙම අරමුණු දෙකම ඉටු වන ආකාරයට කටයුතු කිරීම අවශ්‍ය වේ.

❖ වාණිජ බැංකු වල කාර්යයන්

- තැන්පතු භාරගැනීම
  - ඉල්ලුම් තැන්පතු
  - ඉතුරුම් තැන්පතු
  - කාලීන තැන්පතු

- ණය හා අත්තිකාරම් ලබා දීම
- කෙටිකාලීන ණය
  - අයිරා පහසුකම් සැලසීම
  - බිල්පත් වට්ටම් කිරීම

- නියෝජිත සේවා සැපයීම
- පොදු උපයෝගීතා සේවා සැපයීම
  - උගස් සේවා සැපයීම
  - විදේශ විනිමය හා සම්බන්ධ ගණුදෙණු වලට පහසුකම් සැලසීම
  - විදේශ බැංකු කටයුතු වලට සහාය වීම
  - බැංකු අණකර හා ණයපත් නිකුත් කිරීම

❖ වාණිජ බැංකුවක වත්කම් හා වගකීම්

- වාණිජ බැංකුවක වත්කම්

1. ද්‍රව්‍යශීල වත්කම්

   - අතැති මුදල් ශේෂ
   - මහ බැංකුවෙන් අයවිය යුතු මුදල් ශේෂ
   - දේශීය බැංකුවලින් අයවිය යුතු මුදල් ශේෂ
   - එකතු වෙමින් පවතින මුදල් ශේෂ
   - පිටරට බැංකුවලින් අයවිය යුතු මුදල් ශේෂ

   } ප්‍රාථමික සංචිත (මුදල් අයිතම)

   - භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර
   - රජයේ වෙනත් සුරකුම්පත්
   - මිලට ගත් හා වට්ටම් කළ බිල්පත්

   } ද්විතීයික සංචිත (ඉපැයීම් වත්කම්)

2. ණය හා අත්තිකාරම්
3. ස්ථාවර හා අනෙකුත් වත්කම්

- වාණිජ බැංකුවල වගකීම්
    1. අයිතිකරුවන්ගෙ ප්‍රාග්ධනය
    2. මුළු තැන්පතු
    3. දේශීය ණය ගැනීම්
    4. විදේශීය ණය ගැනීම්
    5. අනෙකුත් වගකීම්

❖ **වාණිජ බැංකු මුදල් මැවීම**

- වාණිජ බැංකුවල අධි සංචිත ණයට දීම තුළින් පැවති තැන්පතු මෙන් කිහිප ගුණයකින් තැන්පතු බිහිකිරීමට වාණිජ බැංකුවලට ඇති හැකියාව වාණිජ බැංකු මුදල් මැවීම ලෙස හඳුන්වයි.

- වාණිජ බැංකු වලට මුදල් මැවීම සඳහා තිබිය යුතු පූර් ව අවශ්‍යතා

    - අධි සංචිත පැවැතීම
    - බැංකු ක්‍රමයෙන් පිටතට මුදල් ගලා යාමක් සිදු නොවීම
    - බැංකු ණය සඳහා ආර් ථිකයේ ඉල්ලුමක් පැවතීම

❖ ආර් ථිකයේ තනි වාණිජ බැංකුවක් පමණක් පවතින විට මුදල් මැවීම සිදු වන ආකාරය

- තැන්පතු වලින් ව්‍යවස්ථාපිත සංචිත අඩු කළ පසු අධි සංචිත ලැබේ. අධි සංචිත ණයට නිකුත් කළ පසු ණයකරුවන් විසින් නිකුත් කරන සියලු චෙක්පත් මෙම බැංකුවේ ම තැන්පත් වේ. එම නිසා සංචිතවල වෙනසක් සිදු නොවේ.

- අලුතින් මැවිය හැකි මුළු තැන්පතු (ණය) ප්‍රමාණය අධි සංචිතය තැම්පතු ගුණකයෙන් වැඩි කිරීමෙන් ලැබෙන අගයට සමාන වේ.

- ණය මැවීම අවසන් වූ පසු බැංකුවේ මුලු තැම්පතු ප්‍රමාණය සංචිත හා තැම්පතු ගුණකයෙ ගුණිතයට සමාන වේ.

  උදා : ඒක් වාණිජ බැංකුවක් පමණක් ඇති ආර් ථිකයක ශේෂ පත්‍රය පහතින් දැක්වේ.

වගකීම්	වත්කම්
තැම්පතු 10000	සංචිත 4000
	ණය 6000
10000	10000

ව්‍යවස්ථාපිත භාවිත අනුපාතය 10% නම්,

- ව්‍යවස්ථාපිත සංචිත ප්‍රමාණය = තැම්පතු x සංචිත අනුපාතය

= 10000 x 10/100

= 1000

- අධි සංචිත ප්‍රමාණය = සංචිත - ව්‍යවස්ථාපිත සංචිත

= 4000 - 1000

= 3000

- බැංකුවට ලබාදිය හැකි උපරිම ණය ප්‍රමාණය = අධි සංචිත x තැම්පතු ගුණකය

= 3000 x 1/0.1

= 3000 x 10

= 30000

- ණය ලැබීම අවසන් වූ පසු බැංකුවේ ශේෂ පත්‍රය

මුළු තැම්පතු = සංචිත x තැම්පතු ගුණකය

= 4000 x 10

= 40000

වගකීම්		වත්කම්	
තැම්පතු	40000	සංචිත	4000
		ණය	36000
	<u>40000</u>		<u>40000</u>

❖ **තැම්පතු ගුණකය**

- සංචිත හා තැම්පතු අතර අනුපාතය තැම්පතු ගුණකය ලෙස හදුන්වයි.
- තැම්පතු ගුණකය ගණනය කරන ආකාරය

  තැම්පතු ගුණකය = 1/ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය

❖ **වාණිජ බැංකු රාසියක් පවතින විට මුදල් මැවීම සිදුවන ආකාරය**

- ආර් ථිකයේ වාණිජ බැංකු රාසියක් පවතින විට; බැංකු පද්ධතියේ එක් වාණිජ බැංකුවකට අලුතින් ණය නිකුත් කල හැක්කේ අධි සංචිතයේ ප්‍රමාණයෙන් පමණි.

- එයට හේතුව එම බැංකුව නිකුත් කල ණය. ලබාගත් ණය කරුවන් නිකුත් කල ණය චෙක්පත් වෙනත් බැංකු වලට මාරු වී යනු ඇතයි විශ්වාස කිරීමයි.

- තනි වාණිජ බැංකුවක් පමණක් පවතින විට එම වාණිජ බැංකුවට නිකුත් කල හැකි උපරිම ණය ප්‍රමාණය අධි සංචිත හා තැම්පතු ගුණකයේ ගුණිතයට සමාන වුවත් බැංකු ද්ධතියක් පවතින විට එක වාණිජ බැංකුවකට අලුතින් උපරිම වශයෙන් නිකුත් කල හැක්කේ අධි සංචිතයේ ප්‍රමාණය පමණි.

උදා; 20% සංචිත අවශ්‍යතාවක් ඇති වාණිජ බැංකු පද්ධතියක එක වාණිජ බැංකුවක ශේෂ පත්‍රය පහතින් දැක්වේ.

වගකීම්		වත්කම්	
තැම්පතු	100000	සංචිත	25000
		ණය	75000
	100000		100000

- මෙම බැංකුවේ අධි සංචිත ප්‍රමාණය = සංචිත - ව්‍යවස්ථාපිත සංචිත

  = 25000 – (100000 x 20/100)

  = 25000 – 20000

  = 5000

- මෙම බැංකුවට උපරිම වශයෙන් නිකුත්කල හැකි ණය ප්‍රමාණය 5000කි.
- ඒම ණය නිකුත් කළ පසු බැංකුවේ ශේෂ පත්‍රය

වගකීම්	වත්කම්
තැම්පතු 105000	සංචිත 25000
	ණය 80000
105000	105000

- ණය චෙක්පත් නිශ්කාශනය වූ පසු බැංකුවේ ශේෂ පත්‍රය

වගකීම්	වත්කම්
තැම්පතු 100000	සංචිත 20000
	ණය 80000
100000	100000

- ණය මැවීම අවසන් වූ පසු බැංකු පද්ධතියේ ඒකාබද්ධ ශේෂ පත්‍රය

මුළු තැම්පතු = සංචිත x තැම්පතු ගුණකය

= 25000 x 1/0.2

= 25000 x 5

= 125000

වගකීම්	වත්කම්
තැම්පතු 125000	සංචිත 25000
	ණය 100000
125000	125000

- වාණිජ බැංකු වලට ණය මැවීමේ දී පවතින සීමාවන්
  - වාණිජ බැංකු අධි සංචිත පවත්වා ගැනීමට කැමති වීම.
  - බැංකු පද්ධතියෙන් පිටතට මුදල් කාන්දු වී යාම.
  - බැංකු ණය සඳහා ආථරීකයේ ඉල්ලුමක් නොමැතිවීම.

අභ්‍යාස :-

1. 10% සංචිත අවශ්‍යතාවක් ඇති ඒකාධිකාරී වාණිජ බැංකුවක ශේෂ පත්‍රය පහතින් දැක් වේ.

වගකීම්		වත්කම්	
තැම්පතු	1000	සංචිත	200
		ණය	800
	1000		1000

ගණුදෙනු කරුවෙකු මෙම බැංකුවේ අලුතින් රු. 100/- ක් තැම්පත් කලේ යැයි සිතන්න. එම තැම්පතුවෙන් පසු මෙම බැංකුවට කොතරම් ණය ප්‍රමාණයක් අලුතින් සැපයිය හැකිද?

2. සංචිත අවශ්‍යතාව 10% ක වන බැංකු ක්‍රමයක එක් වාණිජ බැංකුවක ශේෂ පත්‍රය පහතින් දැක්වේ. මෙම ආර්ථිකයේ මහජනයා සතු මුදල් ප්‍රමාණය 2000කි.

වගකීම්		වත්කම්	
තැම්පතු	20000	සංචිත	6000
		ණය	14000
	20000		20000

I. බැංකුවේ අධි සංචිත ප්‍රමාණය ගණනය කරන්න.

II. මෙම බැංකුවට උපරිම වශයෙන් කොතරම් ණය ප්‍රමාණයක් අලුතින් සැපයිය හැකිද?

III. තැම්පතු ගුණකයේ අගය ගණනය කරන්න.

IV. ණය මැවීම අවසන් වූ පසු බැංකු පද්ධතියේ ඒකාබද්ධ ශේෂ පත්‍රයත් ආර්ථිකයේ මුදල් සැපයුමත් ගණනය කරන්න.

3. 20 % සංචිත අවශ්‍යතාවක් ඇති වාණිජ බැංකු පද්ධතියක එක් වාණිජ බැංකුවක ශේෂ පත්‍රය පහතින් දැක්වේ.

වගකීම්		වත්කම්	
තැම්පතු	10000	සංචිත	3000
ප්‍රාග්ධනය	2000	සුරකුම්	1000
		ණය	8000
	<u>12000</u>		<u>12000</u>

මෙම බැංකුවෙන් රු. 500/- ක තැම්පතුවක් ගණුදෙනුකරුවෙකු විසින් ඉවත් කර ගත් පසු අධි සංචිත ණය දීම තුළින් බැංකු පද්ධතියට මැවිය හැකි උපරිම ණය ප්‍රමාණය ගණනය කරන්න.

4. වාණිජ බැංකු පද්ධතියක එක් වාණිජ බැංකුවක ශේෂ පත්‍රය පහතින් දැක්වේ.

වගකීම්		වත්කම්	
තැම්පතු	100000	ව්‍යා. සංචිත	10000
ප්‍රාග්ධනය	2 5000	අධි සංචිත	5000
		සුරකුම්	30000
		ණය	80000
	125000		125000

I. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ගණනය කරන්න.

II. ගණුදෙනු කරුවෙක් රු. 3000ක තැම්පතුවක් ඉවත් කර ගත් පසු අධි සංචිත ණයට දීමෙන් පසුව බැංකු පද්ධතියේ ඒකාබද්ධ ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

5. 10 % සංචිත අවශ්‍යතාවක් ඇති වාණිජ බැංකු ක්‍රමයක එක් වාණිජ බැංකුවක ශේෂ පත්‍රය පහතින් දැක්වේ. මහජනයා සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණය 2000කි.

වගකීම්	වත්කම්
තැම්පතු 10000	සංචිත 1900
	සුරකුම් 3100
	ණය 5000
10000	10000

I. ගණුදෙනු කරුවෙක් රු. 1000/- ක තැම්පතුවක් බැංකුවෙන් ඉවත් කර ගන්නේ යැයි සිතන්න. එම තැම්පතුව ඉවත් කර ගත් පසුව මහ බැංකුව සංචිත අවශ්‍යතාව 20 % දක්වා වැඩි කලේ නම් බැංකුවේ වත්කම් හා වගකීම් වෙනස් වෙන ආකාරයත් මුදල් සැපයුමත් ගණනය කරන්න.

II. මහ බැංකුව සංචිත අවශ්‍යතාව 5 % දක්වා අඩු කලේ නම් ඉහත කොටසේ දැක්වෙන බැංකුවේ වත්කම් හා වගකීම් වෙනස් වෙන ආකාරයත් මුදල් සැපයුමත් ගණනය කරන්න.